# සොඳුරු මිතුදම



ශේන්යා දසනායක

# සොඳුරු මිතුදම

ශේන්‍යා දසනායක

# සොඳුරු මිතුදම

## ශේන්යා දසනායක

**පාසල** : මහාමායා බාලිකා විදුහල

**ඉගෙනුම ලබන පංතිය** : 7 වසර A

**කෘතිය පළ කරන දිනය** : 2026.06.10

**ISBN** :

# පිදුම

අකුරු කරන්නට මට කියා දුන්

මගේ ආදර ගුරුවරුන්ටත් .....

දිවි සරි කරන්නට වෙහෙසෙන

මගේ දෙමාපියන්ටත් .....

මගේ ආදර අයියාටත් .....

ආදරයෙන් පුදමි ......

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන "හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය" නම් කළ හැකි ය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

**ශශිකලා සේනාධීර,**

**විදුහල්පතිනිය,**

**මහාමායා බාලිකා විද්‍යාලය.**

# සුභාශිංසන පණිවිඩය



මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.

සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි.

එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආර්ශවාදය පිරිනමමි.

මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

**සරත් බී.එස්. අභයකෝන්,**
**ආණ්ඩුකාරවර, මධ්‍යම පළාතඳ**
**සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**
**2026-05-10**

# සුභාශිංසන පණිවිඩය



වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

**ප්‍රදීප් නිලංග දෑල,**

**දියවඩන නිලමේ,**

**ශ්‍රී දළදා මාලිගාව.**

2026-05-10

# සොඳුරු මිතුදම

එකමත් එක කාලෙක පිටිසර ගමක යාළුවෝ දෙන්නෙක් හිටියා. එක යාළුවෙක්ගේ නම ටුට්සි. ටුට්සි ඉස්කෝලේ ඇරිලා එනකම් එයාගේ යාළුවා මෙලී ගඟ ළඟට වෙලා බලාගෙන ඉන්නවා.

මෙලී තනිව ජීවත් වුණ දුප්පත් ළමයෙක්. පාසල් යන්න, අකුරු ඉගෙන ගන්න ආසා වුණත් දුප්පත්කම නිසා එහෙම පාසල් යන්න එයාට බැරි වුණා. ටුට්සි පාසලට අරන් යන කෑම එක නොකා අරං ඇවිත් මෙලී එක්ක බෙදාගෙන කන්න හුරු වී සිටියා. කෑම කාලා ඉවර වෙලා ටුට්සි මෙලීට පාඩම් කියලා දෙනවා.





මෙලී ජීවත් වුණේ කඳු පාමුල තියෙන පුංචි ගල් ගුහාවක. මෙලී පුළුවන් විදිහට මැටි පිරියම් කරලා ගුහාව ලස්සනට තියාගෙන හිටියා. මෙලී එක්ක පුංචි යාළුවෙක් ඒ ගුහාවේ හිටියා. ඒ දිළිසෙන ලොම් තියෙන ලේන් පැටියෙක්. මෙලී එයාට කියන්නේ 'ටිමී' කියලා. ටිමී කියලා ලේන් පැටියෙක් ගුහාවේ ඉන්නවා කියලා කිසිම කෙනෙක් දන්නේ නෑ. මෙලී එයාට එළියට යන්න දෙන්නේ නෑ. දිළිසෙන ලොම් දැකලා මිනිස්සු එයාව අරං යයි කියලා මෙලී බය වුණා.

"මෙලී.... මෙලී...." ගුහාවේ දොරටුව පැත්තෙන් ආ සද්දයට මෙලී තිගැස්සුනා.

"ටිමී ඔයා හැංගෙන්න" මෙලී ටිමීව හැංගුවා.




"සුභ උදෑසනක් මෙලී... අද මං ආවා ඔයා බලන්න". ටුටිසි එයාගේ හුරතල් බලු පැටියා "මැක්ස්" වත් එක්කගෙන ඇවිත් තිබුණා.

"එන්න අපි කෑම කමු"

ටුටිසි එයා ගෙනා කෑම පාර්සලය දිග හරිමින් කීවා. යාළුවෝ දෙන්නා කෑම කන අතරේ මැක්ස් ගුහාව පුරා ඉව කරමින් අහු මුළුවල රිංගමින් මොනවාදෝ සොයනවා කියලා මෙලී දැක්කා. මැක්ස් හොයන්නේ "ටිමී" වෙන්න ඇති කියලා හිතුව මෙලී,

"මැක්ස්, එන්න ඇවිත් කන්න..." කියලා කෑම ටිකක් බිම දැම්මා. මැක්ස් දුවගෙන ඇවිත් කෑම ටික කෑවා. එතකොට මෙලී දැක්කා මැක්ස්ගේ නහය ටිමීගේ ඇඟේ ලොම්වල පාටින්ම දිලිසෙනවා.

ටිකක් වෙලා සෙල්ලම් කරලා ටුට්සි ගෙදර යන්න පිටත් වුණා.

"අපි හෙට ගඟ ළඟදි හම්බ වෙමු.... අපි ගිහිං එන්නං ..."

ටුට්සි මැක්ස් එක්ක ආපහු යන දිහා දුකෙන් බලාගෙන හිටිය මෙලී බර කල්පනාවකට වැටුණා.

"මැක්ස්ගේ නහය ටිමීගේ ලොම්වල පාටින්  පාටින් දිලිසුනේ කොහොම ද?" මේක වුණේ කොහොමද කියලා හොයා ගන්නම ඕනෑ. මෙලී අදිටන් කර ගත්තා.



"මොනවා හරි දිලිසෙන දෙයක් ගුහාවේ ගුල් ඇතුළේ තියනවා. ඒත් මට ඒවාට රිංගන්න බෑනේ."

මෙලී උපක්‍රමයක් යෙදුවා. දිග ලීයකට පන්දමක් සවි කරලා ගුහාවේ සිදුරුවලට දාලා බැලුවා. ඉන් සිදුරු කිහිපයක් ඇතුළේ මොනවා හරි දෙයක් තිබිලා දිලිසුනා. ඒත් ගුහා බිත්ති කඩලා ඒවා ගන්න මෙලීට ශක්තියක් නැහැ. අවශ්‍ය උපකරණත් නැහැ. ඒ හින්දා මෙලී ලීයට පොල් කටුවක් සවි කරලා ගුහා සිදුරුවලින් පස් ටිකක් එළියට ගත්තා. ඒ පස්වල පුංචි පුංචි රත්තරන් කැබලි තිබුණා.

"දෙවියනේ.. ගුහා බිත්තිවලට එහායින් රන් ආකරයක් තියෙනවා වෙන්න ඇති" ටිමී සිදුරු ඇතුළට රිංගන නිසා එයාගේ ඇඟේ  රත්තරන් කුඩු ගෑවෙනවා වෙන්න ඇති.."පුංචි මෙලී එහෙම හිතුවා.





මෙලී ගමේ හඳුනන ගෙදරකට ගිහින් යකඩ උලක් ඉල්ලාගෙන ඇවිත් මුළු රැය පුරාම මහන්සි වෙලා ගුහාවේ බිත්ති හෑරුවා. අඩි කිහිපයක් හාරන විට මෙලීට රන් කුට්ටි කිහිපයක් හමු වුණා. තවත් ඇතුලට රන් ආකරය දිවෙන බව මෙලීට තේරුණා. "මට ජීවත් වෙන්න මේ හොඳටම ඇති" මෙලී ගුහාවේ හෑරූ බිත්තියට පස් පුරවලා නැවත වසා දැමුවා.

රැය පුරාම මහන්සි වෙලා හිටිය නිසා මෙලීට හොඳටම නින්ද ගියා. වෙනදා වගේ ටුට්සි බලන්න ගඟ ළඟට යන්නත් බැරිවුණා.



"අද මොකද මෙලී ආවේ නැත්තේ? අසනීපයක්වත් ද?" ගඟ ළඟට ඇවිත් නොසිටි නිසා ටුටිසි මෙලීව බලන්න යන්න පිටත් වුණා.

"මෙලී... මෙලී..." ටුටිසි මෙලීට කථා කළා. ඒත් සද්දයක් නැති නිසා ටුටිසි ගුහාවට එබිලා බැලුවා. මෙලී හොඳටම නිදි.

"මෙලී... මෙලී... නැගිටින්න. ඔයා අසනීපෙන් ද?" ටුටිසි මෙලීව ඇහැරෙව්වා.

"අනේ මට අද එන්න බැරිවුණා ටුටිසි, මට සමාවෙන්න"... මෙලී නැගිටින ගමන් කිව්වා.

"කමක් නෑ. ඔයා මුහුණ සෝදාගෙන එන්න. අපි කෑම කමු" ටුට්සි කිව්වා.

කෑම කන අතරේ මෙලී රන් ආකරයේ විස්තරය ගැන ටුට්සිට කිව්වා. ටුට්සි පුදුමයෙන් ඒක අහගෙන සිටියා.

"මේක ඔයාගේ වාසනාව මෙලී... හදවතින් පොහොසත් ඔයා දැන් මිල මුදලිනුත් පොහොසත්"

"ඒත් මේ ගැන ඔයා කාටවත්ම කියන්න එපා. නැත්නම් මේ වාසනාවම ඔයාට අවාසනාවක් වෙන්න පුළුවන්. අපි මේකට හොඳ සැලසුමක් හදා ගනිමු."

"අපි හෙට උදේම කඩමණ්ඩියට ගිහින් මේ රන් ටිකක් විකුණලා මේ ගුහාව වටකරලා ඔයාට ඉන්න ගෙයක් හදා ගනිමු" ටුට්සි යෝජනා කළා.

යාළුවෝ දෙන්නා කඩමණ්ඩියට ගිහින් රත්තරන්වලින් ටිකක් විකුණුවා.

"මේ රන් බොහොම පිරිසිදු ඒවා. කොහෙන්ද හම්බ වුණේ?" රන් මුදලාලි ප්‍රශ්න කළා.

"මේ ... මේ ... ගඟ අයිනේ සෙල්ලම් කරද්දි ගඟේ තිබිලා හම්බ වුණේ..." මෙලී ගොත ගසමින් කිව්වා. එයා එහෙම කිව්වේ කපටි රන් වෙළෙන්දා රන් ආකරය ගැන දැනගත්තොත් ලොකු කරදරයක් වෙන නිසයි.

රන් විකුණලා ලැබුණු මුදලින් මෙලී ගුහාව මැදි කරලා ලස්සන පුංචි ගෙයක් සාදා ගත්තා. මෙලීට ඉන්න ලස්සන, රහස් කාමරකුත් හැදුවා. දැන් මිල මුදලින්

හිඟයක් නැති නිසා එයා පාසල් යන්න පටන් ගත්තා. යාළුවෝ දෙන්නා හොඳින් ඉගෙන ගෙන ලොකු අය වුණාම රන් ආකරය ගැන තීරණය කරනකම් ඒක රහසක් විදිහට තියා ගත්තා.

මෙලී බොහොම ධනවත් කෙනෙක් කියලා දැන දැනත් ඒ ධනයට වඩා අධ්‍යාපනය වටිනා බව දන්න නිසා ඇය හොඳින් ඉගෙනුම් කටයුතු කළා.





**ඒ අතරේ රන් වෙළෙන්දා දිනපතාම පැය දෙක තුනක් ගඟ අයිනේ රන් කැබලි සොයමින් කාලය ගත කළා.**

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.

පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිලමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

**සෙනෙවිරත්න මහලේකම්**
**ව්‍යාපෘති නිර්මාතෘ**
**සම්බන්ධීකාරක**